# සෞඛ්‍ය අමාත්‍යාංශය
## 2023 වර්ෂය සඳහා හෙද පුහුණු පාඨමාලාවට බඳවා ගැනීම පිණිස අන්තර්ජාලය හරහා ඉදිරිපත් කලයුතු අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස්

1. අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය සහ මෙම උපදෙස් පත්‍රිකාවේ සඳහන් සියලු කරුණු ඉතා හොඳින් කියවන්න.

2. අයදුම්පත් ඉදිරිපත් කල යුත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ www.health@gov.lk නිළ වෙබ් අඩවිය ඔස්සේ පමණි.

3. මේ සඳහා සුදුසුකම් ලබන්නේ 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ යන අවස්ථාවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයට විද්‍යා විෂය ධාරාවෙන් පෙනී සිට සමත් වූවන් පමණි. ( අදාල තොරතුරු ගැසට් නිවේදනයේ ඡේද අංක 02. යටතේ දැක්වෙන අංක 01 වගුවේ සඳහන් වේ.)

4. **අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2023.10.18 වේ. එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කල හැක්කේ එක් අයදුම්පතක් පමණි.**

5. **ඉතා වැදගත් -**

5.1 එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත්කල හැක්කේ එක් අයදුම්පතක් පමණි. එක් අයදුම්පතකට වඩා වැඩියෙන් ඉදිරිපත්කර ඇති අයදුම්කරුවන්ගේ සියලු අයදුම්පත් කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2019 සහ 2020 යන වර්ෂ දෙකෙන්ම අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් අයෙකුට වුවද ඉදිරිපත් කල හැක්කේ එක් අයදුම්පතක් පමණි. එවැනි අයදුම්කරුවන්ට තම මනාපය අනුව තෝරාගනු ලබන එක් වර්ෂයකින් පමණක් අයදුම්පතක් ඉදිරිපත් කල හැකිය. වර්ෂ දෙකෙන්ම අයදුම්පත් ඉදිරිපත් නොකල යුතුය. එසේ නොමැතිව වර්ෂ දෙකෙන්ම අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වේ නම් එකී සියලු අයදුම්පත් ද කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.2 පසුගිය වසර කිහිපයක් තුල බඳවා ගැනීම් පිළිබඳව අවධානය යොමු කිරීමේදී එක් සිසුවෙකු විසින් රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද යටතේ විවිධ රාජ්‍ය ආයතන විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා කිහිපයක ලියාපදිංචිම නිසා, සුදුසුකම් සහිත තවත් සිසුන් ගණනාවකට එවැනි එක් අවස්ථාවක් හෝ නොලැබීයාමේ තත්වයක් නිරීක්ෂණය විය. ඊට අමතරව මෙම තත්වය නිසා රජයේ මුදල් අපතේ යාමක් සිදුවන අතරම පාඨමාලාව අවසානයේදී අපේක්ෂාකල පුහුණු වෘත්තිකයින් සංඛ්‍යාව නොමැතිවීම නිසා අදාල ආයතනවල සැළසුම්ගත ඉලක්කයන්ද ඉටුකරගත නොහැකිවේ. එබැවින්, මෙම තත්වය අවම කර සෑම අයදුම්කරුවෙකුටම එක් අවස්ථාවක් හෝ හිමිකරදීමට අවශ්‍ය ප්‍රතිපාදන මෙම ගැසට් නිවේදනයෙහි අංක 5 ඡේදය මගින් ප්‍රකාශයට පත්කර ඇත. ඒ අනුව අංක 5.1 සිට 5.5 දක්වා වන අනුඡේද වලින් සවිස්තරාත්මකව දක්වා ඇති පරිදි නුසුදුසු අයෙකු මේ සඳහා අයදුම් නොකල යුතුය. කෙසේ වෙතත්, එවැනි නුසුදුසුකම් පවතින අයෙකු මේ සඳහා අයදුම්කර, පසු අවස්ථාවකදී අනාවරණය වුවහොත් ඔවුන්ට විරුද්ධව ගැසට් නිවේදනයේ 6.3 අනුඡේදය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

5.3 පසුගිය බඳවාගැනීම් වලදී සාවද්‍ය තොරතුරු (සාවද්‍ය විභාග වර්ෂ, විෂයන්, ලබා ඇති ශ්‍රේණි යනාදිය) ඇතුලත් කර අයදුම්පත් ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වූ අතර, සමහර අයදුම්කරුවන් ව්‍යාජ තොරතුරු ඇතුලත්කර සකස් කරන ලද සහතික සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කර ඇති බවද නිරීක්ෂණය විය. එය බරපතල වරදකි. එබැවින්, කිසිඳු අයදුම්කරුවෙකු තමා විසින් ඉදිරිපත් කරනු ලබන විද්‍යුත් අයදුම්පතට සාවද්‍ය තොරතුරු ඇතුලත් නොකල යුතුය. සාවද්‍ය තොරතුරු ඇතුලත්කර ඉදිරිපත් කර ඇති සෑම අයදුම්පතක්ම කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කර, එවැනි අයදුම්කරුවන්ට විරුද්ධව නිත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමුකරන අතර ඔවුන්ගේ නම් නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඇතුලත් කිරීමටද කටයුතු කරනු ලැබේ.

5.4 සෑම අයදුම්කරුවෙකු විසින්ම පළමුව මෙම ගැසට් නිවේදනයේ සහ වෙබ් අඩවියෙහි ඉදිරිපත් කර ඇති විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස් පත්‍රිකාවේ සඳහන් සියලූම කරුණු ඉතා හොඳින් කියවා තේරුම්ගෙන මෙම පාඨමාලාව සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමට තමන් සුදුස්සෙකු බවට තහවුරු කර ගත යුතුය. අනතුරුව ගැසට් නිවේදනයේ 7.2 ඡේදයට අනුව ඕනෑම ලංකා බැංකු ශාඛාවකට රු. **1000**/- ක මුදල ගෙවා ලබාගත් රිසිට්පත, 9.4, 9.5, හා 9.6 යන ඡේදවල දක්වා ඇති ලේඛණ ද සූදානම් කරගෙන අයදුම්පත සම්පූර්ණ කිරීමට කටයුතු කිරීමෙන් ඔබට අයදුම්පත් යොමුකිරීමේ ක්‍රියාවලිය සාර්ථකව සිදුකල හැකිය.

6. **අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා අයදුම්කරු සතුව තිබිය යුතු ලේඛන හා තොරතුරු.**

- **ජාතික හැඳුනුම්පත**
- **ඔබගේ උස (සෙ.මී) වලින් දැක්විය යුතුය**
- **අ.පො.ස. (සා.පෙළ) / (උ.පෙළ) සහතික සහ Z අගය දැක්වෙන ලේඛනය**
- **ඇමතුම් ලබාදියහැකි ජංගම දුරකථන අංක දෙකක්**
- **ගැසට් පත්‍රයේ 7.2. ඡේදය අනුව රු. 1000/- ක ගාස්තුව බැංකුවට ගෙවීමෙන් පසු ලබාගත් රිසිට්පත**

7. ජංගම දුරකථන අංකයක් ඇතුලත් කල යුතුය. අයදුම්කරුට තමාගේ සහ පියාගේ හෝ මවගේ හෝ භාරකරුගේ හෝ ජංගම දුරකථන අංකයද ඇතුලත් කල හැකිය.

8. අයදුම්කරුවන් විසින් රු. 1000/- ක මුදල ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ ගිණුම් අංක 7041318 දරණ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ ගිණුමට ගෙවිය යුතු අතර, මෙම ගෙවීම ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් සිදුකල හැකිය. එලෙස ගෙවා ලබාගත් රිසිට්පතේ මුද්‍රිත අංකය අයදුම්පතේ නියමිත ස්ථානයට ඇතුලත් කල යුතු අතර, එම රිසිට්පත අයදුම්කරු සන්තකයේ සුරක්ෂිතව තබා ගත යුතුය. **මෙවර අයදුම්පත් ගාස්තු ගෙවීම ටෙලර් යන්ත්‍රයක් මගින් හෝ අන්තර්ජාල බැංකු සේවා මඟින් සිදුකල නොහැක.**

9. **අන්තර්ජාලය හරහා අයදුම්පත සම්පූර්ණ කිරීමේදී සැලකිය යුතු කරුණු ;**

**9.1** අයදුම්පත සම්පූර්ණ කල යුත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි.

**9.2** අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී යොදාගත් ජාතික හැඳුනුම්පත් අංකයම භාවිතා කල යුතුය.

**9.3** අදාල විභාග අංක ඇතුලත් කල පසු අ.පො.ස. (උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ස්වයංක්‍රීයව උත්පාදනය වේ. කෙසේ වෙතත් එම ප්‍රතිඵල වල කිසියම් වෙනසක් තිබේ නම්, ඔබ සතුව ඇති ප්‍රතිඵල ලේඛණයේ සඳහන් ප්‍රතිඵල අයදුම්පතෙහි ඊට පහලින් ඇති කොටසෙහි සඳහන් කල යුතුය.

10. විශේෂ අවධානයට

10.1 ගැසට් නිවේදනය සහ ඉහත උපදෙස් ඉතා හොඳින් කියවා තේරුම් ගෙන මේ සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට විද්‍යුත් අයදුම්පත පිරවීමේදී කිසියම් තාක්ෂණික ගැටළුවක් මතුවුවහොත් එම තාක්ෂණික ගැටළුව විසඳා ගැනීම සඳහා පමණක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ සම්බන්ධීකරණ අංශයේ 0112 340 007 දුරකථනයට සතියේ දිනවල (රජයේ නිවාඩු දින හැර) ඇමතීමෙන් උපදෙස් ලබාගත හැකිය. **hrcodmoh@gmail.com** විද්‍යුත් තැපැල් ලිපිනයෙන්ද සම්බන්ධ විය හැකිය. (මෙහිදී සැමවිටම ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ ඔබව සම්බන්ධකර ගත හැකි දුරකථන අංකයක් සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.)

**වෙනත් කරුණු පිළිබඳව විමසා ඇමතුම් ලබාදීමෙන් වලකින්න.**

10.2 සම්පූර්ණ කරන ලද අයදුම්පත අන්තර්ජාලය හරහා ඉදිරිපත් කිරීමෙන් පසුව එහි මුද්‍රිත පිටපතක් ලබාගෙන සුරක්ෂිතව ඔබ සන්තකයේ තබාගන්න.

10.3 ගැසට් නිවේදයේ 9.1. ඡේදය අනුව සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් පසු තෝරාගත් අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ පළකරනු ලබන අතර, කිසිවෙකුට පුද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.කෙසේ වෙතත්, අවස්ථානුකූලව පැනනගින විශේෂිත තොරතුරු පිළිබඳව දැනුවත් කිරීමට අවශ්‍ය වුවහොත් ඒවා ඔබ විසින් අයදුම්පත සමග ඉදිරිපත් කර ඇති දුරකථන අංක සහ විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ සිදුකරනු ලැබේ. එබැවින්, අයදුම්පත සමග ඉදිරිපත් කරන ලද දුරකථන අංක සහ විද්‍යුත් තැපැල් ලිපිනය නොවෙනස්ව, සක්‍රියව තබාගැනීම ඔබගේ වගකීමක් වන අතර, එවායේ වෙනස්වීම් මත හෝ අක්‍රියව පැවතීම මත අදාල තොරතුරු නිසි කලට සංනිවේදනය නොවීම නිසා සිදුවිය හැකි ගැටලු සහගත තත්වයන් සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය වගකියනු නොලැබේ.